# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2382/02 - 2024 අප්‍රේල් මස 29 වැනි සඳුදා - 2024.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 4/2003

### 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය, එම පනතේ 8 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, එම පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

ජනාධිපති.

2024 අප්‍රේල් මස 29 වැනි දින,<br>කොළඹ දී ය.

නියෝග

2022 දෙසැම්බර් මස 15 වැනි දින අංක 2310/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් සංශෝධිත පරිදි වූ, 2022 ඔක්තෝබර් මස 20 වන දින අංක 2302/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 අංක 1 දරන සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම් පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 4 වන නියෝගයේ (1) වන අනුනියෝගයේ "ඉලෙක්ට්‍රොනිකව සහ අන්‍යාකාරයෙන්" යන වචන වෙනුවට "ඉලෙක්ට්‍රොනිකව හෝ අන්‍යාකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි 5 වන නියෝගයේ -

(අ) (3) වන අනුනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(3) සෑම තේරීම් කමිටුවක් ම තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය -

(අ) පහත දැක්වෙන තැනැත්තන් අතරින් තේරීම් කමිටුවේ සභාපතිවරයා වීම සඳහා තෝරාගනු ලැබිය යුතු එක් තැනැත්තකු :-

(i) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා;

(ii) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත සහකාර අධ්‍යක්ෂවරයා (සැලසුම්);

(iii) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ගණකාධිකාරවරයා; හෝ

(iv) අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් නම් කරනු ලබන මාණ්ඩලික ශ්‍රේණියේ වෙනත් යම් රජයේ නිලධරයකු; සහ

(ආ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත, පහත දැක්වෙන තැනැත්තන් අතරින් තෝරා ගත යුතු තැනැත්තන් දෙදෙනෙකු -

(i) සමාජ සේවා නිලධරයකු;

(ii) වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධරයකු;

(iii) ජනපද නිලධරයකු;

(iv) සමෘද්ධි කළමනාකරුවකු;

(v) පරිපාලන ග්‍රාම නිලධාරිවරයකු; හෝ

(vi) පරිපාලන නිලධරයකු.".

(ආ) (8) වන අනුනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(8) මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි, ඉල්ලුම්කරුවන්ගේ දත්ත එක්රැස් කර ප්‍රකාශනයේ සපයා ඇති තොරතුරුවල නිරවද්‍යතාව පරික්ෂා කිරීමේ සහ නිශ්චය කිරීමේ කාර්යය සඳහා එකී දත්ත රඳවා තබා ගැනීමේ කාර්යය ඉටු කරනු ලබන (මෙහි මින්මතු " සංගණන නිලධරයා' යනුවෙන් සඳහන් කරනු ලබන) ග්‍රාම නිලධාරිවරයා හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඒ සඳහා යොදවනු ලබන වෙනත් යම් ක්ෂේත්‍ර නිලධරයෙකු විසින් ඉල්ලුම්කරු පදිංචි ස්ථානය වෙත යා යුතුය.";

(ඇ) (10) වන අනුනියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුනියෝගය ඇතුළත් කිරීමෙන් :-

"(11) පනතේ 23 වන වගන්තියේ විධිවිධාන, (10) වන අනුනියෝගය යටතේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබා ගැනීම පිණිස සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් ලැයිස්තුව යාවත්කාලීන කිරීමේ කාර්යය සඳහා අදාළ විය යුතු ය.".

(3) එහි 6 වන නියෝගයේ -

(අ) (3) වන අනුනියෝගයේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(අ) යම් අභියාචනා කමිටුවක් පත් කරනු ලබන්නේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සම්බන්ධයෙන් ද, එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය ලේකම්වරයා හෝ යම් අභියාචනා කමිටුවක් පත් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ වෙනත් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සම්බන්ධයෙන් ද, එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය ලේකම්වරයෙකු.

මේ ඡේදයේ කාර්යය සඳහා, "ප්‍රාදේශීය ලේකම්වරයා" යන්නට යම් වැඩ බලන ප්‍රාදේශීය ලේකම්වරයෙකු හෝ ප්‍රාදේශීය ලේකම්වරයාගේ රාජකාරී ආවරණය කරනු ලබන යම් නිලධරයකු හෝ අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් නම් කරනු ලබන මාණ්ඩලික ශ්‍රේණියේ වෙනත් යම් රජයේ නිලධරයකු ඇතුළත් වේ; "

(ආ) (3) වන අනුනියෝගයේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තේරීම් කමිටුවට ඇතුළත් නොවන, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ එකී දිස්ත්‍රික්කයේ සේවයේ නියුතු මාණ්ඩලික ශ්‍රේණියේ රජයේ නිලධරයන් දෙදෙනෙකු; සහ';

(4) එහි 7 වන නියෝගයේ -

(අ) (2) වන අනුනියෝගයේ "සති දහයක්" යන වචන වෙනුවට "දින දහයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (3) වන අනුනියෝගයේ "පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමසාරිස්වරයා වෙත එහි තීරණය දැනුම් දීම කළ යුතු ය." යන වචන වෙනුවට "එකී විරෝධතා හෝ හිමිකම් පෑම් ලැබීමේ දිනයේ සිට දින තිහක් (30) ඇතුළත පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව කොමසාරිස්වරයා වෙත එහි තීරණය දැනුම් දීම කළ යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන්.

EOG 04 - 0235

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.